ලිංගික අපරාධයන්/ලිංගික අපයෝජනයන් පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී ඒ සම්බන්ධයෙන් භාවිතා කරන භාෂාව පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් විය යුතු යැයි අපි පවසමු. මන්දයත්, ඒ සඳහා යොදාගන්නා යෙදුම් ඔස්සේ වින්දිතයින් වෙත සහ මෙවන් සිදුවීම් සම්බන්ධයෙන් සමාජයේ ආකල්පය කෙරෙහි බලපෑමක් සිදුවීමයි.

නිදසුනක් ලෙසින් දක්වන්නේ නම්, "වැනසීම", "බිලිවීම" වැනි යෙදුම් ඔස්සේ වින්දිතයාගේ ජීවිතය සහ අනාගතය එතැනින් අවසාන වන බවට, විනාශ වූ බවට වන සෘණාත්මක අදහසක් ජනිත නොවන්නේද? ඒ වෙනුවට 'ලිංගික අපරාධය' යන්න හෝ, බාලවයස්කාර වින්දිතයෙකු සම්බන්ධයෙන් නම් 'ලිංගික අපයෝජනය' යන්න යෝග්‍ය නොවන්නේද?

එසේම මෙම සිදුවීම දිගහැරුණු ආකාරය දීර්ඝ වශයෙන්, විස්තරාත්මකව, කතාන්තරයක් පවසන ආකාරයේ භාෂාවක් භාවිතයෙන් ඉදිරිපත් කිරීම කෙතරම් යෝග්‍ය වන්නේද? ඒ ඔස්සේ වින්දිත දැරිය විනාශ වූ බවට වන සෘණාත්මක අදහස තවදුරටත් වැඩි වර්ධනය වීමත්, මෙවන් සිදුවීමකදී සමාජය සැලකිලිමත් විය යුතු කරුණු වලට වඩා භාවාතිශය වූ කතාන්දරයකට ප්‍රමුඛත්වයක් ලැබීමත් සිදු නොවේද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Divaina**